# බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අධ්‍යයනයක්

*එන්.කේ.එන්.එන්. විජේතිලක [1]*

බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කරනු ලැබූ අතර අධ්‍යයන පහසුව සලකා 1831 සිට 1948 දක්වා කාල පරිච්ඡේදය තෝරාගනු ලැබී ය. කාලානුරූපී ව බටහිර අධ්‍යාපන ක්‍රමය හමුවේ දේශීය අධ්‍යාපනය ක්‍රමයෙන් අකර්මණ්‍ය වීම ත් සමඟ ස්වදේශිකයන් ද ඉංග්‍රීසි අධ්‍යාපනය කෙරෙහි නැඹුරු වීම නිසා උද්ගත වූ සමාජ ප්‍රශ්න වර්තමානය තුළ ද දැක ගත හැකි ය. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට ක්‍රියාත්මක වූ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි යටිතල පහසුකම් සංවර්ධනය ලාංකීය සමාජයට කෙබඳු බලපෑමක් කළේද? යන ගැටලුව ඔස්සේ පර්යේෂණය සිදු කළ අතර" බ්‍රිතාන්‍ය අධ්‍යාපනයට පදනම් වූ හේතු විමසීම, වත්මන් අධ්‍යාපන රටාවට මූලාරම්භය සැපීමට බ්‍රිතාන්‍යයන්ගේ දායකත්වය මෙන් ම ප්‍රගතිය විමර්ශනය කිරීම අරමුණු කර ගන්නා ලදී. පර්යේෂණය" මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල විමර්ශනය හරහා සිදු කර ඇත. ඉංග්‍රීසි යටත් විජිත පාලකයන් විසින් මෙරට ක්‍රියාත්මක කළ අධ්‍යාපන ක්‍රමය සමස්තයක් වශයෙන් ඇඟයීමේ දී දිවයින පුරා පාසල් ගොඩනැගිලි ඉදිකිරීම ත්, ගුරුවරුන් පත් කිරීම හා පුහුණු කිරීම, ක්‍රීඩා පහසුකම් ඇති කිරීම මෙන් ම අධ්‍යාපන සුභ සාධක සේවා අනුගමනය කිරීම හඳුනාගත හැකි ය. අනිවාර්ය අධ්‍යාපන ව්‍යවස්ථාව පැනවීමත් සමඟ අධ්‍යාපනික යටිතල පහසුකම් සැපයීමේ ප්‍රමාණය වැඩි කිරීමට බ්‍රිතාන්‍යයන්ට සිදු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශිෂ්‍යයන් දෛනික ව පාසලට වාර්තා කිරීම මෙන් ම සාක්ෂරතාව ද ක්‍රමයෙන් ඉහළ ගියේ ය. ලංකාව බාහිර ලෝකයට විවෘත වීම, කාන්තාවන්ට පුරුෂයන්ට මෙන් සමාජයක් ලැබීම, ග්‍රාමීය මෙන්ම වෘත්තීය අධ්‍යාපනය දියුණු වීම, විශේෂ අවශ්‍යතා සහිත සිසුන් වෙනුවෙන් පාසල් ඉදිවීම සිදු වූයේ අධ්‍යාපනයෙහි යටිතල පහසුකම් දියුණුවීම නිසා බව නිගමනය කළ හැකි ය. සමස්තයක් ලෙස මෙම අධ්‍යයනය තුළින් බ්‍රිතාන්‍ය පාලන සමයේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙන් ම එහි සංකීර්ණ අධ්‍යාපන-සමාජ විචල්‍යතා අවබෝධ කර ගැනීමට උපකාරී වේ.

***ප්‍රමුඛ පද:*** අධ්‍යාපන, ප්‍රතිසංස්කරණ, බ්‍රිතාන්‍යය, යටිතල, සංවර්ධනය

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
nadeekavijethilaka1998@gmail.com